


# සන්නස සමඟ දස වසරක්

"ඒයි මචං සිසිර !" දුරකතනයෙන් එහා කෙළවරින් ඇසුනේ අපගේ ජ්‍යෙෂ්ඨ හිතවතා ජගත් ජේ. එදිරිසිංහගේ හඬ.

අවුරුද්දත් එක්ක අල්ලලා මොනවා හරි ලියලා එවපං පිටුවකට විතර සෑහෙන්න. අපි අළුතෙන් වැඩක් පටන් ගන්නවා. ඒකට දාන්න. හැබැයි හෙට වෙනකොට ඕන...."

ජගත් මේ කරන්නේ විධානයක් ද ? නැත. ඒ ජගත්ගේ හැටිය. මම හිත අස්වසා ගත්තෙමි.

"මේ තදියමේ ? මොකද්ද බං, උඹලගේ ඔය පත්තරේ නමවත් කියන්න බැරිද ලිපි ලියන්න කලින් ?.

"සන්නස" සන්නස !" ජගත් කතාකරන්නේ පත්තරේ අච්චු ගහන අතරේවත් ද ? ඒ තරමටම හදිස්සිය.

"පුළුවන්නං මොනව හරි ඇදලත් එවපං...."

"හරි මචං" මා පිළිතුරු දෙන විටත් ජගත් දුරකථනය විසන්දි කර හමාරය. මාගේ "හරි" ය නැතත් ලිපිය නම් ජගත්ට අවශ්‍ය විය. ඒ ජගත්ගේ හැටිය.

මීට අවුරුදු දහයකට පෙර වුණ සිද්ධියකි, ඒ. සිංහල අවුරුද්දේ තනිව නැසෙමු ද ? එක් ව නැගෙමු ද ?" මැයෙන් මා ලියූ ලිපිය මුල් ම සන්නස මාසිකයේ තුන වන පිටේ පළ වී තිබිණ. ඒ අනුව එය සන්නසේ මුල්ම ලිපියයි. හදිසියෙන් ඇඳ යුවූ රේඛා චිත්‍රය ද ඒ සමඟ පළ විණ. මේ සමඟ පළ වෙන්නේ ඒ චිත්‍රයයි. එය සන්නසේ මුල්ම චිත්‍රයයි.

2005 මැයි මාසයේ සන්නස මාසිකයේ පටන් මාගේ " පන්හිඳයි - පින්සලයි" කොලම ලිවීම ඇරඹුවෙමි. නිදහස් ආරයේ කොලමක් ලෙසින් තමන්ගේ සිතට එන දේ ලිවීමට සන්නස මා හට වේදිකාව තනා දුන්නේ " පන්හිඳයි - පින්සලයි" කොලමට ඉඩ කඩ ලබා දෙමිනි. ඊට චිත්‍ර සටහනක් ද අනිවර්යෙන්ම ඇන්දෙමි.




මා ආනන්ද විද්‍යාලයේ හය වන, හත්වන ශ්‍රේණිවල ඉගෙනීම ලබද්දී මා හට පන්ති මිත්‍රයින් තැබූ අන්වර්ථ නම් ගණනාවකින් එකකි "පිනසලයා" යන්න. ඊට එක් හේතුවක් වූයේ මා චිත්‍ර ඇදීමයි. අනෙක නම් කෙසඟ සිරුරකුත් වැඩුණ කෙසත් ඇති මා ඔවුනට පෙනුනේ කෙදී ඉහල අතට තබා මිටෙන් සිටවූ පින්සලක් ලෙසිනි. අඳින්නෙකුත්, ලියන්නෙකුත් ලෙසින් නොයෙක් අවස්ථාවන්වල නොයෙක් සිද්ධීන් පිළිබඳව මා සිතේ ඇති වූ සංකෝභාවයන්, මා සිත තුළම ඇති වූ තර්කයන් ලියා දැක්වීමට "පන්හිඳයි - පින්සලයි" ලිපියෙන් උත්සාහ කළෙමි. පසු කලෙක එයට තාක්ෂණික අංශයේ සිතුවිලි එක් කිරීමට "පැනසල" චරිතය ද හඳුන්වා දුන්නෙමි. මේ චරිත "පන්", "පින්", "පැන්" වැනි කෙටි නම්වලින් හැඳින් වූ අතර, ඔවුන් තිදෙනාම මේ වන විට විදේශ ගතව චමරියක එකට වසන පන්ති මිත්‍රයින් තිදෙනෙකු වේ. පසු කලෙක මෙල්බන් අවට අපගේ කටයුතු වාර්තාකරණයක් ලෙසින් ද මෙම ලිපිය යොදා ගැනීමට සිදු විය. එය ද

